# රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
## பதிவாளர் நாயகம் திணைக்களம்
## REGISTRAR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No.: RG/AB/01/කාර්යාල නියෝග

**ප්‍රධාන කාර්යාලය**
**தலைமை அலுவலகம்**
**HEAD OFFICE**

තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No.: 565

ඔබේ අංකය / உமது இல. / Your No.:

234/A3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
234/A3, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை.
234/A3, Denzil Kobbakaduwa Mawatha, Battaramulla.

දිනය / திகதி / Date: 2022-12.01


<u>චක්‍රලේඛ අංක: 05/2016 (II)</u>

සියළුම ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් සහ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් වෙත.

<u>කාර්යාලයෙන් බැහැර ස්ථානවලදී</u>
<u>විවාහ ලියාපදිංචි කිරීම සඳහා අවසර ලබාගැනීම</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් වූ මගේ සමාංක හා 2022-11-01 දිනැති 05/2016(1) චක්‍රලේඛය හා බැඳේ.

02. විවාහ ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් වෙත පැවරී ඇති ව්‍යවස්ථාපිත බලතල ක්‍රියාත්මක කළයුත්තේ මහජන සේවාවන් ඉටුකිරීමට බාධාවක් නොවන අයුරින් බව අවධාරණය කරමින් එකී චක්‍රලේඛයේ 02 ඡේදය පහත පරිදි සංශෝධනය කරන බව දන්වමි.

> 02. කොට්ඨාශයේ විවාහ රෙජිස්ට්‍රාර්වරයා විවාහ ලියාපදිංචිය සඳහා කැඳවා ගැනීමට නොහැකි අස්ථාවලදී ඒ බවට විවාහ පාර්ශ්වකරුවන් වෙතින් අදාල ඉල්ලීම ලබාගතයුතු අතර, අදාල ඉල්ලීම් ලිපිය සමග විවාහය ලියාපදිංචි කරන දිනට අවම වශයෙන් දින 14කට පෙර කළාප කාර්යාලය වෙත යොමුකර නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල් වෙතින් අවසර ලබාගත යුතුය. එසේම විවාහ ලියාපදිංචියට කාර්යාලයෙන් පිටතට යාම තම රාජකාරියට බාධා නොවන අයුරින් සිදුකිරීමට වගබලා ගත යුතුය.

03. අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් කාර්යාලයෙන් බැහැරව විවාහ ලියාපදිංචියේදී තම තනතුරේ හා දෙපාර්තමේන්තුවේ ගෞරවය රැකෙන ආකාරයෙන් කටයුතු කිරීමට දැඩි අවධානයක් යොමු කළ යුතු අතර, අක්‍රමිකතා ආදිය සිදුවී ඇති බවට තහවුරු වුවහොත් ඒ පිළිබඳව දැඩිව ක්‍රියා කරන බවද වැඩිදුරටත් දන්වා සිටිමි.

04. මෙම චක්‍රලේඛයේ විධි-විධාන 2022-12-01 දින සිට ක්‍රියාත්මක වේ.

පී.එස්.පී.අබේවර්ධන
රෙජිස්ට්‍රාර් ජනරාල්

<u>පිටපත්:.</u>

1. අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්
2. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල් (පාලන/සිවිල්/නොතාරිස්)
3. සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්
4. ප්‍රධාන ගණකාධිකාරී
5. ප්‍රධාන අභ්‍යන්තර විගණක
6. කලාප භාර නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්/ සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්

(5, 6) ඉහත පරිදි අවශ්‍ය කටයුතු සඳහා සහ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් විවාහ ලියාපදිංචි කිරීම සඳහා අවසර ඉල්ලීමේදී ඔවුන්ගේ රාජකාරියට ඉන් බාධාවක් සිදුවන්නේද යන්න නිරන්තර අධීක්ෂණයෙන් යුතුව අවශ්‍ය අවසරය ලබාදීම සඳහා.


දුරකථන අංකය / தொலைபேசி இல. / Telephone No.: 2889488, 2889489
ෆැක්ස් අංකය / தொலைநகல் / Fax No.: 2889491
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.rgd.gov.lk
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-mail: rgd@sltnet.lk, rg@rgd.gov.lk